(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(9).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 අගෝස්තු 22 සිකුරාදා**

**2025 සැප්තැම්බර් 09 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනා සම්මතය,— 2025.08.21 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර 2025 පෙබරවාරි 12 දින අත්සන් කරනු ලැබුවා වූ ගිවිසුම, එම විදේශ රාජ්‍යයේ ජාතිකයන්ගේ හෝ එම රාජ්‍යයේ නීති ප්‍රකාර සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ආයෝජන ශ්‍රී ලංකාවේදී ප්‍රවර්ධනය කිරීම සහ සුරක්ෂා කිරීම සඳහා වන ගිවිසුමක් වන බැවින්, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍ය වන්නක් ලෙස අනුමත කළ යුතු යැයි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා,— පරිපූරක මුදල,— ශීර්ෂය 123 — වැඩසටහන 02— † 2025 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් දහතුන් බිලියන දෙසිය අසූපස් මිලියන හයසිය දහසක් (රු. 13,285,600,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **123** | - | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන | |
| | | | මූලධන වියදම් | රු. 13,285,600,000 |
| | | | **මුළු එකතුව** | **රු. 13,285,600,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2025 අගෝස්තු 22 දින ඉදිරිපත් කරන ලද 2025 අංක 1 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය,— පරිපූරක මුදල,— ශීර්ෂය 171 — වැඩසටහන 02— † 2025 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන එක්දහස් පන්සියයක් (රු. 1,500,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **171** | - | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යවරිය | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 1,500,000,000 |
| | | | **මුළු වියදම** | **රු. 1,500,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2025 අගෝස්තු 22 දින ඉදිරිපත් කරන ලද 2025 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රු. 13,285,600,000

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2025 සැප්තැම්බර් 12 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 75/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම යාවත්කාලීන කිරීම,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම මඟින් ශ්‍රී ලාංකිකයන්ට විශාල ප්‍රතිලාභ හිමිවන හෙයින්, එම ගිවිසුම නැවත යාවත්කාලීන කිරීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 76/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— සුහුරු විදුලිබල පද්ධතියක් සහ සුහුරු මීටර් හඳුන්වා දීම,— පුනර්ජනනීය බලශක්ති ප්‍රභේදයක් ලෙස සූර්ය බලශක්තිය ප්‍රවර්ධනය ඉතා වැදගත් වුවත්, විශේෂයෙන්ම වහල මත සවිකරන ලද සූර්ය පැනල මඟින් ජනනය වන විදුලි ප්‍රමාණය, පද්ධති පාලන මධ්‍යස්ථානයේදී වෙන්කර හඳුනාගත නොහැකි හෙයින්, ජාතික විදුලිබල පද්ධතිය (Grid) සුහුරු තත්ත්වයට (Smart Grid) පත්කිරීමටත්, සුහුරු මීටර් (Smart Meters) හඳුන්වා දීමටත් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 77/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ආහාර රස ගැන්වීමට යොදන අහිතකර කෘත්‍රිම රසකාරක තහනම් කිරීම,— රයිස්, කොත්තු හා නූඩ්ල්ස් වැනි ආහාර රස ගැන්වීමට මෙරට ආපනශාලා සහ හෝටල්වලදී යොදන කෘත්‍රිම රසකාරක, නොයෙක් බෝ නොවන රෝගවලට හේතු වන බව වාර්තාවන හෙයින්, ඒ පිළිබඳව පිළිගත් ආයතනයක් මඟින් නිසි අධ්‍යයනයක් සිදුකර, එම අහිතකර රසකාරක තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 78/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— මඩකලපුව සිට පොතුවිල් දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම හෝ මාතර සිට කල්මුණේ දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම,— මඩකලපුව සිට පොතුවිල් දක්වා දුම්රිය මාර්ගය සහ මාතර සිට කල්මුණේ දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම මඟින් මඩකලපුව, අම්පාර හා මොනරාගල යන දිස්ත්‍රික්කවල විශාල ජනතාවකට ප්‍රතිලාභ ලැබෙන හෙයින්, මඩකලපුව සිට පොතුවිල් දක්වා හෝ මාතර සිට කල්මුණේ දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 79/2025

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— ජපන් ජබර ශාකයේ ව්‍යාප්තිය හිතකර ලෙස පාලනය හා මර්දනය කිරීම,— ජපන් ජබර නොහොත් Eichhornia crassipes (Mart.) Solms යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන ආක්‍රමණශීලී ශාකය, වර්තමානයේ ගොවි බිම් සහ වගුරු බිම් වසා පැතිරී ගොස් ඇති හෙයින් ද, මෙහි ශීඝ්‍ර වර්ධන වේගය හේතුවෙන් දේශීය ශාක අභිබවා ජෛව පරිසර පද්ධතියට තර්ජනයක් වී ඇති හෙයින් ද, මෙම තත්ත්වය හේතුවෙන් රොන් මඩ තැන්පත් වී ජල ප්‍රවාහන මාර්ග සහ ජල බැස්ම අවහිර වීම මඟින් ජල ගැලීම් හා ගංවතුර තත්ත්ව ඇති වී ඇති හෙයින් ද, එදිනෙදා භාවිතයට අවශ්‍ය වන ජලයේ තත්ත්වයට හානිවීම සහ ජල විදුලි උත්පාදනයේදී බාධා ඇති වී ඇති හෙයින් ද, රසායනික වල් නාශක භාවිතය මඟින් ඒවා මර්දනය එම ජලය පරිහරණය කරන පුද්ගලයින්ට සෞඛ්‍ය අවදානමක් ඇති කරන හෙයින් ද, මදුරු කීටයන් බෝවීම හා එමඟින් බරවා හා ඩෙංගු වැනි රෝග ව්‍යාප්තවීම සිදු වී ඇති හෙයින් ද, මෙම ශාකය හිතකර ලෙස පාලනය හා මර්දනය මඟින් තිරසර විසඳුමක් උදෙසා රජය විසින් අදාළ ව්‍යාපෘති යෝජනා සැකසීම කාලෝචිත බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 80/2025

ගරු ඉම්රාන් මහරුෆ් මහතා,— කොරෝනා වසංගතය පැවති කාලය තුළ, ඒකපාර්ශ්විකව හා බලහත්කාරයෙන් මුස්ලිම් ජනතාවගේ මෘතදේහ ආදාහනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවක් පිහිටුවීම,— කොරෝනා වසංගතය පැවති කාලය තුළ, ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශයන්ට පටහැනිව

ඒකපාර්ශ්විකව හා බලහත්කාරයෙන් ආදාහනය කරන ලද මුස්ලිම් ජනතාවගේ මෘතදේහ සංඛ්‍යාව, එලෙස ආදාහනය කරන ලද පුද්ගලයින්ගේ නම් හා ලිපිනයන් යනාදී තොරතුරු විමර්ශනය කිරීම සඳහාත්, මෙසේ මෘතදේහ බලහත්කාරයෙන් ආදාහනය කිරීමට හේතු වූ පසුබිම මෙන්ම බලහත්කාරයෙන් ආදාහනය කරන ලද පුද්ගලයින්ගේ ඥාතීන්ගේ මානසික තත්ත්වය පිළිබඳව විමර්ශනය කිරීම සඳහාත්, මෙයට අනුබල දෙමින් මාර්ගෝපදේශයන්ට පටහැනිව කටයුතු කළ දේශපාලනඥයන් ඇතුළු රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව විමර්ශනය කිරීම සඳහාත්, කොමිෂන් සභාවක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— රසායන ද්‍රව්‍ය යොදා පලතුරු ඉදවීම නතර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පලතුරු වෙළඳපොළ තුළ ස්වාභාවිකව පැසී ඉදුණු පලතුරු වෙනුවට, නොපැසුණු පලතුරු රසායන ද්‍රව්‍ය යොදා කෘත්‍රිමව ඉදීමට සලස්වා අලෙවි කරනු ලබන හෙයින් ද, ආනයනික පලතුරු ද රසායන ද්‍රව්‍ය යොදා කෘත්‍රිමව ඉදීමට සලස්වා අලෙවි කරනු ලබන හෙයින් ද, මෙම පලතුරු වැඩි වශයෙන් දරුවන් විසින් ආහාරයට ගනු ලබන හෙයින් ද, කූට ව්‍යාපාරිකයින් රටේ අනාගතය විනාශ කරමින් ලාභ ලැබීමේ පරමාර්ථයෙන් සිදු කරන මෙම ක්‍රියාව නතර කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ආයතන ප්‍රධානීන් පත්කිරීමේ නිර්ණායකයක් ලෙස ප්‍රධාන කාර්ය සාධන දර්ශකය යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීමේ දී ජ්‍යෙෂ්ඨත්වය සේම ඔවුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPl - Key Performance Indicator) නිර්ණායකයක් ලෙස යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් රාජ්‍ය සේවයට ඇතුළත් කොට, ඒ අනුව ආයතන ප්‍රධානීන් පත්කිරීමට නිර්දේශ ලබා ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් හට තනතුරු ලබා දීමේ දී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය සලකා බැලීම, — පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ අමාත්‍යවරුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI - Key Performance Indicator) වාර්ෂිකව පරීක්ෂා කර, ඔවුන්ට තනතුරු ලබා දීමේ දී එකී දර්ශකය සලකා බලා, තනතුරු ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන් වෙනත් තනතුරුවලට පත්කිරීමේ දී ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම, — අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන්, ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන්, එකී තනතුරු දැරීම නතර වූ තැන් සිට අවම වශයෙන් වසර තුනක කාලයක් රාජ්‍ය සේවයේ, සංස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා, විනිශ්චය මණ්ඩලවල හෝ විදේශ සේවයේ (තානාපති වැනි) තනතුරුවලට පත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

**2025 සැප්තැම්බර් 23 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

717/2025

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ස්වාභාවික දොළ මාර්ග ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ස්වාභාවික දොළ මාර්ග ආශ්‍රිතව පැවතිය යුතු දොළ රක්ෂිතයට අදාළ භූමි ප්‍රමාණය කොපමණද;

(iii) දොළ රක්ෂිත බලහත්කාරයෙන් අත්පත් කර ගෙන ඇති පුද්ගලයන් සඳහා නීතිය ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, ඒ වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දොළ රක්ෂිත සින්නක්කර ඉඩම් ලෙස ලබාදී ඇති බව දන්නේද;

(ii) එලෙස ලබාදී ඇති කළුතර දිස්ත්‍රික්කයේ දොළ රක්ෂිත භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම දොළ රක්ෂිත භූමි නැවත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

972/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය සහ කිලිනොච්චිය දිස්ත්‍රික්කවල රජයේ ප්‍රාදේශීය රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් රෝහලේ අනුමත වෛද්‍යවරුන්, හෙදියන් සහ වෙනත් සේවකයන් සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඉහත දිස්ත්‍රික්කවල රෝහල්වල ඖෂධවේදීන්ගේ පුරප්පාඩු තිබේද;

(v) එම පුරප්පාඩු පුරවන දිනය කවරේද;

(vi) ඖෂධවේදීන් බඳවාගැනීමට සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවද, පත්වීම් ලබාදී නොමැති බැවින් පත්වීම් ලබාදෙන දිනය කවරේද;

(vii) ඉහත රෝහල්වල ගිලන් රථ රියදුරන්ගේ පුරප්පාඩු තිබේද;

(viii) එම පුරප්පාඩු පුරවන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) යාපනය, වේලනෙයි ප්‍රාදේශීය රෝහල B ශ්‍රේණියට ශ්‍රේණිගත කර තිබේද;

(ii) එය බලපැවැත්වෙන දිනය කවරේද;

(iii) ශ්‍රේණිගත කිරීමට අනුකූලව එම රෝහලේ අනුමත සේවකයන් සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රේණිගත කිරීමට සාපේක්ෂව රසායනාගාර සහ කාර්ය මණ්ඩල පහසුකම් ලබාදී තිබේද;

(v) නොඑසේ නම්, ඒවා ලබා දීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

978/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.07.07 වන දින පේදුරුතුඩුවේ (වෙට්ට්‍රිලෙයි කේණික්කඩල්) සිට ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම සඳහා පිටත්ව ගිය එම්. එෆ්. මුස්තකීන්, එන්. ගුණපාලසිංගම්, ඒ. රාධා ක්‍රිෂ්ණන් සහ ප්‍රේමසිරි නමැති ධීවරයන් දින 194කට පසුව ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට ගෙන්වා ගනු ලැබූ බව දන්නේද;

(ii) එම ධීවරයන් වෙනුවෙන් වන්දි මුදල් ලබා දුන්නේද;

(iii) එසේ නම්, එම වන්දි මුදල් සම්බන්ධයෙන් විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1071/2025

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් 'රටලංකාව' නමැති ඉඩමේ විශාලත්වය කොපමණද;

(ii) එම ඉඩමෙන් එක් එක් ආයතනය වෙත බැහැර කර ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත ඉඩමෙන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත වෙන් කර ඇති ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩමේ ඉඩම් කැබලි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයන්ට ලබා දීම සඳහා නිසි අනුමැතියක් තිබේද;

(ii) එසේ නම්, එම අනුමැතියට අදාළ ලිපියේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) නොඑසේ නම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වෙනත් ඉඩමකට ලබා ගත් අනුමැතිය භාවිතා කර, වංචනික හා අනීතික ආකාරයෙන් ඉහත ඉඩමේ කොටස් බෙදා දීමට කටයුතු කර තිබේද;

(iv) ඉහත ඉඩමේ කාලයක සිට අනවසරයෙන් පදිංචිවී සිටින පවුල් සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1074/2025

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කුරුඳු වගා කරනු ලබන දිස්ත්‍රික්ක කවරේද;

(ii) කුරුඳු වගා කර ඇති බිම් ප්‍රමාණය කොපමණද;

(iii) කුරුඳු වගාව සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පිහිටුවා ඇති රජයේ ආයතන කවරේද;

(iv) එම ආයතන අතරින් ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති ආයතන කවරේද;

(v) එම ආයතන පිහිටුවීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(vi) එම ආයතන මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින්නේද;

(vii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1100/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අතිදුෂ්කර පාසැල්වල දීර්ඝ කාලයක සිට විදුහල්පතිවරුන් ලෙස සේවය කළ/සේවය කරන විදුහල්පතිවරුන් 2012.08.08 දිනැති අංක අමප/12/1101/530/035 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අධිසේවක පදනම මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2(ii) ශ්‍රේණියේ හා 3 ශ්‍රේණියේ විදුහල්පතිවරුන් ලෙස පත් කළ බවත්;

(ii) 2021.11.23 දිනැති අංක අමප/21/1824/308/139 දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ 2022.06.02 දිනැති අංක PSC / EST / 02 -05 / 01 / 2020 දරන ලිපිය ප්‍රකාරව ඔවුන්ගේ පත්වීම් ස්ථිර කළ බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) පාසැල් වර්ගීකරණය අනුව අනෙකුත් පාසැල්වල විදුහල්පතිවරුන්ට ගෙවනු ලබන පරිපාලන දීමනාව ඉහත (අ)හි සඳහන් විදුහල්පතිවරුන්ටද 2018 මාර්තු දක්වා ගෙවූ නමුත්, මේ වනවිට එය නොගෙවන බව දන්නේද;

(ii) ඊට හේතු කවරේද;

(iii) විදුහල්පති පුරප්පාඩු සඳහා පත්වීමට සහ අනෙකුත් විදුහල්පතිවරුන් සමඟ සුහද මාරු සඳහා කරනු ලබන ඉල්ලීම් මේ වනවිට ප්‍රතික්ෂේප කරන බව දන්නේද;

(iv) ඊට හේතු කවරේද;

(v) අභ්‍යන්තර හා අන්තර් කලාප ස්ථාන මාරුවීම් සහ උසස්වීම් ඉහත (අ)හි සඳහන් විදුහල්පතිවරුන්ට ලබා දෙන්නේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1104/2025

ගරු සුරංග රත්නායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2023, 2024 සහ 2025 වර්ෂයේ පළමු කාර්තුව තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද බඩඉරිඟු ප්‍රමාණය සහ ආනයනය කරන ලද බඩඉරිඟු ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ බඩඉරිඟු නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා මේ වනවිට සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ බඩඉරිඟු අස්වැන්න නෙළන කාලවලදී ගොවියාට සාධාරණ මිලක් ලබා දීමට හැකියාවක් තිබේද;

(iv) බඩඉරිඟු මිල උච්ඡාවචනය වීම පාලනය කිරීම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1111/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික් මහා රෝහලේ ස්ත්‍රී සහ පුරුෂ වෛද්‍ය නේවාසිකාගාර සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති අතර එම නේවාසිකාගාර තාවකාලික ගොඩනැගිලිවල පවත්වාගෙන යන බවත්;

(ii) ඉන්දීය රජයේ ආධාර මත ස්ථිර වෛද්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීමට වර්ෂ 2017-2018 කාල වකවානුවේදී සැලසුම් කිරීම ආරම්භ කරන ලද බවත්;

(iii) 2024 වර්ෂයේදී ඊට අදාළ පාංශු පරීක්ෂණය සිදු කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනතෙක් ඉහත ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු ආරම්භ නොකිරීමට හේතු;

(ii) ඉහත සැලසුම මේ වනවිටත් බලපවත්වන්නේ නම්, එම වෛද්‍ය නේවාසිකාගාරයේ ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරනු ලබන දිනය;

(iii) ඉහත ගොඩනැගිල්ල ඉදිකිරීම අත්හිටුවා හෝ අවලංගු කර තිබේ නම්, ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

1252/2025

ගරු සුනිල් රත්නසිරි මහතා,— ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම සමාගමේ සේවක පුරප්පාඩු තිබේද;

(iii) 2024 වර්ෂයේදී සමාගම උපයා ඇති ලාභය කොපමණද;

(iv) එම සමාගමේ සේවාවන් ලබා ගෙන ගෙවීම පැහැර හැර ඇති මුළු වටිනාකම කොපමණද;

(v) එම වටිනාකම අය කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1265/2025

ගරු අශෝක ගුණසේන මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල්ගහවෙල, පොතුහැර, අලව්ව ජල යෝජනා ක්‍රමයෙන් පානීය ජලය ලබා දීමට නියමිත ප්‍රදේශ කවරේද;

(ii) එමඟින් පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආවරණය නොවන ප්‍රදේශ කවරේද;

(iii) මේ වනවිට උග්‍ර පානීය ජල හිඟයකින් පීඩා විඳින පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්‍රාම නිලධාරී වසම් 13ක පවුල් 2500කට අධික සංඛ්‍යාවක් ඉහත යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවන බව දන්නේද;

(iv) ඊට හේතු කවරේද;

(v) ඉහත යෝජනා ක්‍රමයේ මුල් සැලසුමෙහි එම වසම්වලට ජලය ලබා දීමට පැවති වැඩපිළිවෙළ පසුව වෙනස් කර තිබේද;

(vi) ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2025 අයවැයෙන් ඉහත යෝජනා ක්‍රමයට වෙන් කරන ලද ප්‍රතිපාදන වැය කරන අරමුණු කවරේද;

(ii) එමඟින් ඉහත අ(iii)හි සඳහන් ගැටලුවට විසඳුම් ලබා දෙන්නේද;

(iii) ඉහත යෝජනා ක්‍රමය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගෙන තිබේද;

(iv) එසේ නම්, ඉහත පවුල්වලට පානීය ජලය ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, ඉහත යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 සැප්තැම්බර් 24 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

17/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් දිගු කාලීන හා කෙටි කාලීන ආයෝජනවල ආයෝජනය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආයෝජන සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

118/2024

ගරු වමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මේ වනවිට පවතින නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට නිල නිවාස ලබා ගෙන ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව සහ නිල නිවාස ලබා ගෙන නොමැති පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිල නිවාස ලබා ගෙන ඇති සහ නිල නිවාස ලබා ගෙන නොමැති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

220/2024

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රජය සතුව ඇති බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බිත්තර වී අවශ්‍යතාවය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විවිධ කාලගුණික හා දේශගුණික විපර්යාස හේතුවෙන් බිත්තර වී අවශ්‍යතාවය ඉහළ බැවින් රජය සතුව ප්‍රමාණවත් බිත්තර වී තොගයක් පවත්වා ගෙන යාම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

341/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ කුඩා වැව් 478ක් පමණ තිබෙන බවත්;

(ii) එම වැව් අතරින්, වැව් 200කට වඩා අඩු සංඛ්‍යාවක් පමණක් නඩත්තු කරන අතර ඉතිරි වැව් නිසි පරිදි නඩත්තු නොකරන බවත්;

(iii) එම වැව් ප්‍රතිසංස්කරණය කර නඩත්තු කරන්නේ නම්, ප්‍රදේශයේ ගොවීන් සවිබල ගැන්විය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත සඳහන් නඩත්තු නොකරන වැව්, නිසි පරිදි නඩත්තු කිරීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

624/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට සංක්‍රමණය වන නීති විරෝධී විදේශ සංක්‍රමණිකයන් රඳවා තබා ගැනීම සඳහා මධ්‍යස්ථානයක් මිරිහාන ප්‍රදේශයේ පිහිටුවා ඇති බව දන්නේද;

(ii) එම මධ්‍යස්ථානයේ මේ වනවිට රඳවා තබා සිටින විදේශ සංක්‍රමණිකයන් සංඛ්‍යාව එම එක් එක් පුද්ගලයාගේ රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීති විරෝධී විදේශ සංක්‍රමණිකයන් ශ්‍රී ලංකාවට සංක්‍රමණය වීම පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1113/2025

ගරු රොෂාන් අක්මීමන මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මේ වනවිට සේවය කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා වැය කරනු ලබන මුළු වාර්ෂික වියදම කොපමණද;

(iii) එම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ව්‍යාපෘතිවලින් උපයන ලද වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1119/2025

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හමුදාගත බඳවාගැනීම් යන වර්ගීකරණය යටතේ වෘත්තීය රාජකාරි සඳහා මේ වනවිට ත්‍රිවිධ හමුදාවලට බඳවාගෙන ඇති සංඛ්‍යාව එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් බඳවාගෙන ඇති වෘත්තීන් කවරේද;

(iii) එම වර්ගීකරණය යටතේ ඔවුන් බඳවාගැනීමට හේතු කවරේද;

(iv) රාජකාරිවලට යෙදවීමේදී, ඉහත වර්ගීකරණය යටතේ බඳවාගන්නා ලද හමුදා සාමාජිකයන් සහ සෙසු හමුදා සාමාජිකයන් අතර වෙනස්කම් තිබේද;

(v) එසේ නම්, ඒවා කවරේද;

(vi) සෙසු හමුදා සාමාජිකයන්ට පරිදිම තනතුරු සහ උසස්වීම්, ඉහත වර්ගීකරණය යටතේ බඳවාගන්නා ලද හමුදා සාමාජිකයන්ටත් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ත්‍රිවිධ හමුදාව ප්‍රතිසංවිධානය කරන්නේ නම්, ඉහත වර්ගීකරණය යටතේ බඳවාගත් සාමාජිකයන් ඉවත් කරන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් ගණනය කර තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iv) ත්‍රිවිධ හමුදා ප්‍රතිසංවිධානය කිරීමේදී ඉවත් කරන, ඉවත් කිරීමට නියමිත සහ විශ්‍රාම ගන්වන හමුදා සාමාජිකයන් සම්බන්ධයෙන් වැඩපිළිවෙළක් පිළිබඳව සාකච්ඡා කර තිබේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1179/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ —

(i) තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල ශ්‍රේණිගත කිරීම් අනුව ක්‍රියාත්මක වන්නේද;

(ii) තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල සංඛ්‍යාව ශ්‍රේණි අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ස්ථිර ඉඩම් හා ගොඩනැගිලි සහිත/රහිත තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) දිස්ත්‍රික්කයේ ස්ථිර ගොඩනැගිලි නොමැති උප තැපැල් කාර්යාලවලට ස්ථිර ගොඩනැගිලි ලබා දෙන කාල වකවානු කවරේද;

(v) කිළිනොච්චි, පරන්තන්, පච්චිලෙයිප්පල්ලි සහ පූනරින් තැපැල් කාර්යාලවලට නවීන පහසුකම් සහ පරිගණක පහසුකම් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) භාරතිපුරම්, පූන්නෙයිනීරාවී සහ පල්ලික්කුඩා ප්‍රදේශවල උප තැපැල් කාර්යාල පිහිටුවිය යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, 2016.09.05 දිනැති මාගේ ලිපිය අනුව අමාත්‍යවරයාගේ මහජන සම්බන්ධතා නිලධාරී විසින් තැපැල්පතිට යොමු කළ 2016.09.09 දිනැති අංක PPS&MR / HR / 09-182 ලිපියට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

1242/2025

ගරු තිළිණ සමරකෝන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහ නැගුම ආයතනය මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ආයතනයේ ක්‍රියාත්මකව පවතින කාර්යාල සහ කර්මාන්ත අංගන කවරේද;

(iii) ක්‍රියාත්මක නොවේ නම්, වසා දමා ඇති කාර්යාල සහ කර්මාන්ත අංගන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර, කැකිරාව, ගනේවල්පොල ප්‍රදේශයේ මහ නැගුම අංගනයක් පවතින බව දන්නේද;

(ii) එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එය වසා දැමීමට හේතු කවරේද;

(iv) එහි පවතින යන්ත්‍රෝපකරණ සහ වාහන වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඒවායේ වර්තමාන වටිනාකම කොපමණද;

(vi) ඒවා ශ්‍රී ලංකාවේ මාර්ග සංවර්ධනයට භාවිතා කිරීමට වැඩපිළිවෙළක් තිබේද;

(vii) එම මධ්‍යස්ථානය තවදුරටත් පවත්වාගෙන නොයන්නේ නම්, එය පවරා ගනු ලබන පදනම කවරේද;

(viii) එය පවරා ගනු ලබන ආයතනය කවරේද;

(ix) පවරා ගැනීම සඳහා ගත වන කාලය කොපමණද;

(x) පවරා ගනු ලබන කාල වකවානු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1257/2025

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා, — රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ජීවත් වන පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(ii) එක් නිවසක් තුළ පවුල් ඒකක කිහිපයක් ජීවත් වන අවස්ථා තිබෙන බව දන්නේද;

(iii) එක් නිවසක් තුළ පවුල් ඒකක කිහිපයක් ජීවත් වනවිටදී, එම පවුල් සඳහා ඡන්ද නාම ලේඛන සකස් කිරීමේදී, එම පවුල් වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට ග්‍රාම නිලධාරින් විසින් අනුගමනය කරනු ලබන විධිමත් ක්‍රමවේදය කවරේද;

(iv) එක් නිවසක් තුළ පවුල් ඒකක කිහිපයක් ජීවත් වනවිටදී, එම පවුල් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ප්‍රායෝගික සහ පරිපාලන ගැටලු පැන නඟින බව දන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා විසඳුමක් ලබා දෙන්නේද;

(vi) එම විසඳුම කවරේද;

(vii) විසඳුමක් ලබා නොදෙන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 සැප්තැම්බර් 25 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

204/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඊශ්‍රායලය සඳහා ගුවන් ගමන් ගාස්තු අඩු කරන ලද දිනය කවරේද;

(ii) අඩු කරන ලද ගාස්තු ප්‍රමාණය කොපමණද;

(iii) මේ වනවිට ඊශ්‍රායලයේ සේවය කරනු ලබන ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත සඳහන් ගුවන් ගමන් ගාස්තු අඩු කිරීමේදී විශාල වංචාවක් සිදුවී ඇති බව දන්නේද;

(v) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

227/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ‘පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්’ ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පිහිටුවීමට පොරොන්දු වූ ‘රාජ්‍ය වත්කම් ප්‍රතිෂ්ඨාපන ආයතනය’ මේ වනවිට පිහිටුවා තිබේද;

(ii) එම ආයතනය මඟින් මේ වනවිට රජයට අත්පත් කරගෙන ඇති සොරාගත් වත්කම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ආයතනයේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) 2025 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විසර්ජන පනත් කෙටුම්පත මඟින් හෝ අතුරු සම්මත ගිණුම මඟින් එම ආයතනය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

298/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පරිභෝජනය සඳහා වර්ෂයකට අවශ්‍ය ලුණු ප්‍රමාණය කොපමණද;

(ii) එම ලුණු ප්‍රමාණය සපයා ගන්නා ආකාරය කෙසේද;

(iii) ලුණු නිෂ්පාදනය කරනු ලබන රජයේ ආයතන සහ පෞද්ගලික ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වැඩි වශයෙන් ලුණු නිෂ්පාදනය කරනු ලබන ප්‍රදේශ කවරේද;

(v) ලුණු අස්වැන්න ගබඩා කරනු ලබන ගබඩා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(vi) එම ගබඩාවල ධාරිතාවය සහ එකී ධාරිතාවයන් කොපමණ කාලසීමාවක් සඳහා ප්‍රමාණවත් වන්නේද යන්න වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2024.01.01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ලුණු ආනයනය කර තිබේද;

(ii) එසේ නම්, ලුණු ආනයනය කරන ලද අවස්ථා සංඛ්‍යාව සහ එම එක් එක් අවස්ථාවේදී ආනයනය කරන ලද ලුණු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලුණු ආනයනය කිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

314/2024

ගරු රවී කරුණානායක මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි බැංකුව සතු වත්කම්වල වර්තමාන වටිනාකම කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ තිබෙන සමෘද්ධි බැංකු සංඛ්‍යාව සහ සමෘද්ධි මහා සංගම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සියලු සමෘද්ධි මහා සංගම් සතු වත්කම්වල වර්තමාන වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමෘද්ධි බැංකු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට යටත් වන්නේද;

(ii) නොඑසේ නම්, එය එකී අධීක්ෂණයෙන් බැහැර කිරීමට හේතු කවරේද;

(iii) සමෘද්ධි බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිවරයා කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය වසර 10 තුළ සමෘද්ධි බැංකුව ලැබූ ලාභ/අලාභ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පසුගිය වසර 10 තුළ සමෘද්ධි බැංකුවේ ශේෂ පත්‍ර අගය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සමෘද්ධි බැංකුවේ කොටස් හිමියන් කවුරුන්ද;

(iv) සමෘද්ධි බැංකුව විසින් ගලපන ලද පරිදි, තැන්පතුකරුවන්ට ගෙවන පොලී අනුපාතය සහ ණය ගැණුම්කරුවන්ට ණය දීමේ පොලී අනුපාතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

824/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂයේ සිට 2024 දක්වා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කරන ලද බොර තෙල් ප්‍රමාණය සහ පිරිපහදු කරන ලද තෙල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම තෙල් ආනයනය කිරීමේදී ඊට අදාළ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම කාලසීමාව තුළදී හදිසි මිලදී ගැනීම් ලෙස මිලදී ගෙන ඇති, බොර තෙල් ප්‍රමාණය සහ පිරිපහදු කරන ලද තෙල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) හදිසි මිලදී ගැනීම් හා සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය හරහා කරනු ලබන මිලදී ගැනීම් අතර පවතින මූල්‍යමය වෙනස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

902/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සත්ත්ව සංගණනය සිදු කරන ලද දිනය කවරේද;

(ii) එම සංගණනය සඳහා වියදම් කරන ලද මුදල කොපමණද;

(iii) එම සත්ත්ව සංගණනය කිරීමේ අරමුණු කවරේද;

(iv) එම අරමුණු ඉටු කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) මේ වනවිට එම සංගණනයට අදාළ ප්‍රගතිය කවරේද;

(vi) එම සංගණනය අනුව රිලවුන්, වඳුරන්, දඬුලේනුන් සහ මොනරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සත්ත්ව සංගණනය සිදු කරන ලද ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) සත්ත්ව සංගණනය සිදු නොකරන ලද ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම්වල සත්ත්ව සංගණනය සිදු නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

983/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල ඇතුළු සියලුම කාර්යාලවල සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මණ්ඩලයේ සේවය කරනු ලබන සේවකයන්ගේ වැටුප් සහ ඔවුන්ට අවශ්‍ය අනෙකුත් පහසුකම් නොපිරිහෙලා ලබා දිය යුතු බව පිළිගන්නේද;

(iii) වැටුප් කප්පාදු කිරීමක් සම්බන්ධයෙන් මණ්ඩලයේ සේවකයන් පසුගිය දිනවල උද්ඝෝෂණයක නිරත වූ බව දන්නේද;

(iv) එසේ නම්, එම වැටුප් කප්පාදු කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1123/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවය අතහැර ගොස් සිටින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සෙබළුන්/නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් ශ්‍රී ලංකා පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇති සංඛ්‍යාව සහ භාරවී ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iv) ඔවුන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් ඉවත් කිරීමට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට C-130 ගුවන් යානයක් මිලදී ගැනීමට කටයුතු කරන බව දන්නේද;

(ii) මේ වනවිට ගුවන් හමුදාව සතු C-130 ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගුවන් යානාවල නඩත්තු කටයුතු අවසන්වරට සිදු කරන ලද කාල වකවානු කවරේද;

(iv) නව C-130 ගුවන්යානයක් මිලදී ගැනීමේ අරමුණ කවරේද;

(v) එම නව C-130 යානය පරිත්‍යාගයක්ද; නොඑසේ නම්, මිලදී ගැනීමක්ද;

(vi) එමඟින් ඉටු කර ගැනීමට අපේක්ෂිත කාර්යයන් මේ දක්වා ඉටු කර ගත් ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1159/2025

ගරු අජිත් ගිහාන් මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගොවිපළ ඉස්සන් වගාව සිදු කරන බවත්;

(ii) එහෙත් වෙනත් රටවලින් ශ්‍රී ලංකාවට ඉස්සන් ආනයනය කර ප්‍රතිඅපනයනය කරන බවත්;

(iii) ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවේ ඉස්සන් වගා කර්මාන්තයට සහ එම කර්මාන්තයේ නිරතවන පුද්ගලයන්ට අහිතකර බලපෑමක් සිදු වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඉස්සන් ප්‍රතිඅපනයනය කිරීම වෙනුවට ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව දිරිගැන්වීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1279/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 සහ 2023 වර්ෂවල ගාල්ල දිස්ත්‍රික්කය තුළ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් තේ තවාන් පවත්වාගෙන යාම සඳහා ආධාර ලබාදී තිබේද;

(ii) එසේ නම්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් ආධාර ලබා දුන් තේ තවාන් සංඛ්‍යාව, ආධාරලාභියාගේ නම, ලබා දුන් ආධාර මුදල සහ තේ තවානේ ලියාපදිංචි අංකය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ආධාරලාභීන් අතරින් මේ වනවිට තේ තවාන් පවත්වාගෙන යනු ලබන ආධාරලාභීන්ගේ සහ තේ තවාන් පවත්වාගෙන යනු නොලබන ආධාරලාභීන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 සැප්තැම්බර් 26 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

677/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් ඉන්දියාවේ අදානි සමාගම සමඟ බලාගාර ව්‍යාපෘතියක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබූ බව දන්නේද;

(ii) වර්තමාන රජය විසින් එම ව්‍යාපෘතිය සංශෝධනය කරන්නේද;

(iii) නොඑසේ නම්, අවලංගු කරන්නේද;

(iv) පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයට ජාත්‍යන්තර ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

737/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට කොළඹ වරායේ බහාලුම් නිදහස් කර ගැනීමේ අර්බුදකාරී තත්ත්වයක් මතුවී තිබෙන බවත්;

(ii) එම තත්ත්වය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන සමුද්‍රීය සැපයුම් සමාගම් සහ වාණිජ මණ්ඩල විසින් ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් යෝජනා කර තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සැලැස්මේ ඇති යෝජනා කවරේද;

(ii) එම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

810/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'E-Motoring' ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ අරමුණු කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද ආයතනයේ නම කවරේද;

(iv) එම ආයතනය තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය සඳහා මේ දක්වා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ විවිධ දූෂණ සිදුවී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

834/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වායු ගුණාත්මක දර්ශකය අනුව මහනුවර නගරය ඉතා අවදානම් මට්ටමක පවතින බව දන්නේද;

(ii) ඒ සඳහා බලපාන ලද සාධක කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

880/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා මන්මුනෛපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ‘උරුමය’ සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ ඉහත කාලය තුළ එම පුද්ගලයන්ට ‘උරුමය’ සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) ‘උරුමය’ සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් සමහර පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා ‘උරුමය’ සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

980/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ගොවිපළ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) අනුරාධපුර, ගල්නෑව, හෝගොඩයාගම බීජ ගොවිපළට අයිති ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) එම ගොවිපළ යම් පුද්ගලයෙක්/ආයතනයක් වෙත බදු පදනම මත ලබාදී තිබේද;

(v) එසේ නම්, බදු පදනම මත ලබා දුන් වර්ෂය කවරේද;

(vi) බදු පදනම මත ලබා ගත් පුද්ගලයාගේ/ආයතනයේ නම සහ ලිපිනය කවරේද;

(vii) එම පුද්ගලයා/ආයතනය නිසි පරිදි බදු මුදල් ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1008/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජ මාධ්‍ය වේදිකා හරහා වැරදි තොරතුරු සහ වෛරී කතා, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ වාර්ගික කලබල හෝ කෝලාහල ඇති කරන අන්තර්ගතයන් බෙදා හැරීම නිරීක්ෂණය කිරීමට සහ පාලනය කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) එවැනි හානිකර අන්තර්ගතයන් බෙදා හැරීම වැළැක්වීම සඳහා සමාජ මාධ්‍ය සමාගම්, විදුලි සංදේශ සේවා සපයන්නන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධවී කටයුතු කිරීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එලෙස ගෙන ඇති පියවරවල ස්වභාවය කවරේද;

(iv) එම පියවර ක්‍රියාත්මත කිරීම මඟින් අත්කර ගෙන ඇති ප්‍රගතිය කවරේද;

(v) මාර්ගගතව වෛරී කතා පැතිරවීම, වාර්ගික උසිගැන්වීම් සිදු කිරීම හෝ කලහකාරී ක්‍රියා සංවිධානය කිරීම, අධීක්ෂණය කිරීම සඳහාම වෙන්වූ අධීක්ෂණ ඒකකයක් හෝ අන්තර්-ආයතන කාර්ය සාධක බලකායක් ස්ථාපනය කර තිබේද;

(vi) වෛරී කතා සම්බන්ධයෙන් වගවීම සහතික කිරීම සඳහා ක්‍රියාත්මකව ඇති යාන්ත්‍රණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1210/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොතුවිල්, අරුගම්බේ ප්‍රදේශයේ මුස්ලිම්වරුන්ගේ මෆාසා මුස්ලිම් දේවස්ථානයට ආසන්නව ඊශ්‍රායලයට අයත් නීති විරෝධී 'සබාත් නිවස' නමැති ආයතනයක් ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එම ආයතනය කොපමණ කාලයක සිට ක්‍රියාත්මක වන්නේද;

(iii) එම ආයතනය පිහිටුවා ඇති ඉඩම ලබාදී ඇති පදනම කවරේද;

(iv) එම ආයතනයට දැඩි ආරක්ෂාවක් ලබා දීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට ආකර්ෂණීය ප්‍රදේශයක් වන අරුගම්බේ ප්‍රදේශයේ ජනතාව, දේශීය හා විදේශීය සංචාරකයන්, ධීවරයන් සහ ගොවි ජනතාව බියට පත්වී සිටින බව දන්නේද;

(v) ඉහත ආයතනය ඉවත් කිරීම සඳහා කිසියම් පියවරක් ගෙන තිබේද;

(vi) එම ආයතනය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සහ පොතුවිල් ප්‍රාදේශීය සභාවෙන් වාර්තාවක් කැඳවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1270/2025

ගරු සුජීව දිසානායක මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන භෝග වර්ග තුන කවරේද;

(ii) ප්‍රධාන අපනයන භෝගයක් ලෙස පොල් භෝගය නම් කරන ලද වර්ෂය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ඇති පොල් ගස් සංඛ්‍යාව සහ පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ පොල් අස්වැන්න වැඩි කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොල් ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන කර්මාන්ත කවරේද;

(ii) පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගෙන් ශ්‍රී ලංකාවට ලැබෙන වාර්ෂික විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(iii) පොල් ලෙලි ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන දේශීය කර්මාන්තශාලා සංඛ්‍යාව හා විදේශීය කර්මාන්තශාලා සංඛ්‍යාව, ඒවායේ ප්‍රධාන අපනයන නිෂ්පාදන සහ උත්පාදනය කර ඇති සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) පොල් ලෙලි කර්මාන්තය ආශ්‍රිතව ඇති ප්‍රධාන ගැටලු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1295/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිළිඳු දරුවන්ගේ අධ්‍යාපනික, සෞඛ්‍ය සහ සමාජ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 'රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදල', 2000 අංක 28 දරන (සංස්ථාගත කිරීමේ) පනත අනුව පිහිටුවා ඇති බවත්;

(ii) ගම්පහ දිස්ත්‍රික්කයේ, මීනුවන්ගොඩ, පන්සිල්ගොඩ ග්‍රාම නිලධාරි වසමට අයත් පර්චස් 100ක පමණ විශාලත්වයකින් යුතු ඉඩමක් 2003.04.07 දින එයට පරිත්‍යාග කරන ලද බවත්;

(iii) 2005 වර්ෂයේදී ඉහත ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකර වෘත්තීය පුහුණු ආයතනයක් ආරම්භ කරන ලද අතර 2021 වර්ෂයේදී එම ආයතනය වසා දමන ලද බවත්;

(iv) 2023 වර්ෂයේදී එම ගොඩනැගිල්ල කඩා ඉවත් කර, එම ඉඩම වටා කම්බි ගසා, ගේට්ටුවක් සවිකර, එම ඉඩමේ පොල්පැල සිටුවා එය පුද්ගලික භුක්තියට නතු කර ගැනීමට කූඨ ලෙස හා වංචනික ලෙස කටයුතු කර ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) ඉහත ඉඩම පොදු ජනතාවගේ පොදු කටයුතු සඳහා රජයේ සුදුසු ආයතනයක් වෙත පැවරීමට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 85/2025

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 137 ප්‍රකාරව දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සඳහා වන මතු දැක්වෙන සංශෝධනය පිළිගත යුතු ය:—

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) පළමුවැනි ඡේදයට ඉක්බිතිවම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීමට :—**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතල මූල්‍ය වංචා හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් සෘජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

---